**දඹුල්ල මහා නගර සභාව.**

**--------------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**---------------------------**

1 මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

සභාව විසින් අනුගමනය කරනු ලබන තොග ආගණනය කිරීමේ පදනම ගිණුම් සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.296,644 ක් වටිනා ස්ථාවර වත්කම් 12 ක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නාගරික ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ඖෂධ වටිනාකම වූ රු.263,054 ක ශේෂය තොග යටතේ දක්වා නොතිබුණි.

(ඇ) අත්ට්‍රැක්ටරයක වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් වටිනාකම රු.33,735 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) මහජන පුස්තකාලයට ටයිම් සඟරාව මිලදී ගැනීම වෙනුවෙන් 2017 වර්ෂය සඳහා ගෙවන ලද රු.13,608 ක මුදලක් ඉදිරියට කල ගෙවීම් වශයෙන් දක්වා නොතිබුණි.

(ඊ) මහ නගර සභාව ස්ථාපිත කිරීමේදී වත්කම් හා වගකීම් පැවරීම සම්බන්ධ කමිටු වාර්තාව අනුව දඹුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු මුදල රු.2,870,766 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල දඹුල්ල ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු මුදල ලෙස රු.2,486,917 ක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එම වරද සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.1,049,100 ක් වූ ගිණුම් විෂයන් 2කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.107,350 ක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) 2013 වර්ෂයේ සිට පැවත එන රු.1,079,440 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂ 25 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට පැවත එන රු.2,563,391 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ 34 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ඇ) දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.19,462,096 ක් ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක අගය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.3.5 නීති, රීතිහා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 40 (1) ඊ හා 40 (ආ) 01 වගන්තිය | විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියලබා නොගෙන 2012 දෙසැම්බර් 6 දිනැති අංක 7:2 දරන මහා සභා තීරණය මත දඹුල්ල බස්නැවතුම්පලේ කොටසක් පුද්ගලයෙකු වෙත බදුදී තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 570, 571 | වසර 2 ක් ඉක්ම වූ වටිනාකම රු.40,000 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1996 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2.1.1 ඡේදය | නගර සභාව සතු වාහන 24 කඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඈ) | 2015 ජූලි 10 දිනැති අංක 2/2015 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 හා 2 ඡේද | රාජ්‍ය ආයතන සතු අබලන් වූ අපහරණය කළයුතු යැයි හඳුනාගන්නා වාහන චක්‍රලේඛ දින සිට මාස 3 ක් ඇතුළත අපහරණය කිරීමට කටයුතු කළ යුතු වුවත් 2012 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණු ජීප් රථයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2015 ඔක්තෝබර් 30 දිනැති මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක 2015/08 | රජයේ විවිධ දෙපාර්තමේන්තු වලින් අයවිය යුතු රු.773,350ක හිඟ වරිපනම් ශේෂය අයකරගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙත යොමු කර නොතිබුණි. |

1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
-----------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවක අතිරේක වැඩ ඇස්තමේන්තුගත මුදලින් 10% ක් ඉක්මවන්නේ නම් ඒ සඳහා අදාළ අනුමැතිය ලබාගත යුතු වුවත්, දඹුල්ල බස් නැවතුම්පල සිනමා ශාලාව ඉදිකිරීමේදී ගෙවා තිබුණු 10.77 % ක රු.3,127,104 ක් වූ අතිරේක වැඩ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) දඹුල්ල බස්නැවතුම්පල සිනමා ශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වටිනාකම 2014 අගෝස්තු 14 දින පැවති මහා සභා තීරණ අංක 12.03.03 දරන සභා සම්මුතියෙන් රු.27,005,397 ක් ලෙස අනුමත කර තිබියදී ඇස්තමේන්තු රේටයන් වූ රු.29,208,526 ක වටිනාකම මත ගිවිසුම්ගත වී තිබීම හේතුවෙන් රු.2,023,128 ක් වූ වැඩිපුර වටිනාකමට ගිවිසුම්ගත වී තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.124,471,849 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.5,141,737 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.119,330,112 ක වර්ධනයක්නිරීක්ෂණය විය.

2.2 ආදායම් පරිපාලනය
-------------------------

2.2.1 වරිපනම්බදු
-------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.5,550,674 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ බිල් කළ වරිපනම් බදු ප්‍රමාණය රු.3,713,454 ක් විය. එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබුණේ 53% ක් වන රු.1,978,656 ක් පමණක් වීමෙන් වරිපනම් බදු අය කිරීමේ දුර්වල ප්‍රගතියක් නිරීක්ෂණය විය. හිඟ වරිපනම් බදු ශේෂය තුල වසරකට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.5,550,674 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

(ආ) මහා නගර සභා ආඥා පනතේ230(1) වගන්තිය ප්‍රකාරව නගරය තුල පිහිටි සෑම වර්ගයකටම අයත් නිවාස, ගොඩනැගිලි, ඉඩම් ආදියෙහි වාර්ෂික වටිනාකම් මත වරිපනම් බදු අයකල යුතු බව දක්වා ඇතත් දඹුල්ල නගරය අයත් ග්‍රාම සේවා වසමේ ගම්මාන කිහිපයක් හැර අනෙකුත් ගම්මාන වලින්ද ග්‍රාම නිලධාරී වසම් 13 න් 12 කද වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මහා නගර සභා ආඥා පනතේ 237(1) වගන්තිය ප්‍රකාර වාර්ෂික වටිනාකමට බලපානසේ දේපල භෞතික වෙනස්කිරීම් කරන ලද ව්‍යාපාරික ස්ථාන 68 කට අදාළව නව තක්සේරු කිරීම් හෝ තාවකාලික තක්සේරු කිරීම් සිදුනොකිරීම හේතුවෙන් වරිපනම් බදු ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඈ) නව ඉදිකිරීම් සඳහා නිකුත් කරන ලද අනුකූලතා සහතික 72 කට අදාළව තාවකාලික තක්සේරු මත වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මහා නගර සභාව විසින් 2013, 2014 හා 2015 වර්ෂ සඳහා අනුමත ගොඩනැගිලි සැලසුම් 385 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර වරිපනම් ආදායම ඉහළ නංවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 බදුකුලී
----------

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.33,746,665 ක් වූ හිඟ බදුකුලී ශේෂයෙන් වර්ෂය තුළ රු.7,156,679 ක් පමණක් අයකරගෙන තිබුණු අතර එය මුළු හිඟයෙන් 21% ක අගයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද රු.6,758,379 ක් වූ බදුකුලී වටිනාකමින් වර්ෂය තුළ අයවී තිබුණේ රු.5,205,346 ක්පමණක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට හිඟ බදු කුලී රු.16,416,474 ක් විය.

(ඇ) බස් නැවතුම්පල කඩ කාමර බදුදීමේදී ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු වශයෙන් ගෙවිය යුතු මුදලින් තවදුරටත් අයවිය යුතු රු.11,627,460 ක මුදලක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු වත්කම් බදුදීමේදී වර්ෂ 5 කට වරක් බදුකුලිය සංශෝධනය කර ආදායම් වර්ධනය කරගැනිමට කටයුතු කර නොතිබුණි.

2.2.3 බලපත්‍රගාස්තු
-----------------

සමාලෝචිත වර්ෂයට අදාළව හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු.1,245,900 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරෙන්තු ගාස්තු හා දඩ මුදල් වශයෙන් රු.1,274,165 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 55 ක් පැවතුණි.

(ආ) මහා නගර සභාව වෙත වෙනත් ආයතන වලින් ලබාදී තිබූ වාහන 3 ක්පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් 2016 වර්ෂය තුලදී ප්‍රත්‍යාගණනය කර තිබුණද අංක 73-6905 දරන අත්ට්‍රැක්ටරයක් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

මහා නගර සභාව සතුව තිබුණු වාහන2 ක් වර්ෂ 1 සිට 4 දක්වා කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

වාහන ආදායම් බලපත්‍ර නිසි කලට අලුත්කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආදායම් බලපත්‍ර දඩ වශයෙන් රු.17,135 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මහා නගර සභා බල ප්‍රදේශයේ දිනපතා එකතු වන කසළ වර්ග කිරීමකින් තොරව මෙට්‍රික්ටොන්15 ක් පමණසභාවේ ට්‍රැක්ටර් හා ටිපර් රථයක් යොදා ගනිමින් දිගම්පතහ ප්‍රදේශයේ රජයේ ඉඩමකට බැහැර කරමින් පැවැතුණි.

(ආ) නගර සභාව විසින් කසළ බැහැර කරන ඉඩම ආරක්ෂාකාරී ලෙස වැටක් යොදා සීමා කිරීමට කටයුතු කර නොතිබුණු අතර ප්‍රදේශයේ වෙනත් ආයතන විසින්ද එම ස්ථානයට අවසරයකින් තොරව කසළ බැහැර කර තිබුණි.

(ඇ) කසළ බැහැර කරන ඉඩමේ එක් ප්‍රදේශයකට පමණක් නොව ඉඩමට ඇතුළුවන මාර්ගය දෙපස සිට කසළ බැහැර කර තිබුණු අතර මෙම තත්වය වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි.

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් නගර සභාව 2016 වර්ෂය තුල රු.5,044,790 ක් වැය කර තිබුණද, දිනපතා එකතු කරනු ලබන කසළ දිරන හා නොදිරන ද්‍රව්‍ය වශයෙන් වෙන්කර කසළ ප්‍රතිචක්‍රීකරන වැඩසටහන් සඳහා යොමුකිරීමට සභාව විසින් අවධානය යොමු කර ඇතත් ඒ සඳහා නිසි ඉඩමක් නගර සභාවට ලබා ගැනීමට නොහැකිව තිබුණි.

3.5 පාරිසරික ගැටළු

--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දඹුල්ල නගර සභාව විසින් දිනපතා එකතු කරනු ලබන කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා වැඩසටහනක් නොතිබීම හා අවිධිමත් බැහැර කිරීම හේතුවෙන් පරිසර හානි මහජන සෞඛ්‍ය ගැටළු ඇතිවීමද, වල් අලි හා ගවයින් ඇතුළු අනෙකුත් සතුන් කසළ ආහාරයට ගැනීම නිසා බරපතල සෞඛ්‍ය ගැටළු ඇතිවී තිබුණි.

(ආ) සභාවට අයත් රථ වලින් ගෙන එනු ලබන මල අපද්‍රව්‍ය විධිමත් ක්‍රමවේදයක් සහිතව බැහැර කර නොතිබූ අතර දිගම්පතහ රජයේ ඉඩම තුළ වළවල් කපා බැහැර කර තිබීම හේතුවෙන් පරිසරය අපවිත්‍ර වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 46 ක් සඳහා සලසා දී තිබුණු රු.28,072,400 ක එකතු වටිනාකමකින් යුතු වූ ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයයන් 15 ක් සඳහා ඇති කළ ප්‍රතිපාදන වලින් රු.5,935,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 89 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදන හා තථ්‍ය වියදම අතර 13% සිට 99% දක්වා වූ පරාසයක විචලනයක් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ප්‍රමාණවත් පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අභ්‍යන්තර විගණන ඒකකයක් 2015 වර්ෂයේ ස්ථාපිත කර තිබුණු අතර, මේ සඳහා එක් නිලධාරියෙකු පමණක් අනුයුක්ත කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

5. පද්ධති හා පාලනය
----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වාහන පාලනය
(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඇ) ආදායම් පරිපාලනය